(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(11).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 නොවැම්බර් 06 සිකුරාදා**

**2026 නොවැම්බර් 14 සෙනසුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යටතේ යෝජනා සම්මතය,— 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 6(6) වගන්තිය යටතේ, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් වෙත පාර්ලිමේන්තු යෝජනාවක් මඟින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවිය යුතු අතර, එම පාරිශ්‍රමිකය කොමිෂන් සභාවේ අරමුදලින් දැරිය යුතු හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය ඇතිව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ඉංජිනේරු, නීති හෝ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයන්හි සුදුසුකම් හා පළපුරුද්ද සහිත කොමසාරිස්වරුන් පස්දෙනෙකු පත් කිරීම සම්බන්ධයෙන් පනතේ 6(6) වගන්තියේ දක්වා ඇති විධිවිධාන සැලකිල්ලට ගනිමින් සහ එම කොමසාරිස්වරුන් විසින් ඉටු කළයුතු වගකීම්වල ප්‍රමාණය හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සඳහා පහත සඳහන් පරිදි පාරිශ්‍රමික සහ අනෙකුත් දීමනා ගෙවීම වෙනුවෙන් අංක 26/1892/804/220 හා 2026.09.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇති හෙයින් ද:—

| පාරිශ්‍රමික/දීමනා | සභාපති | සාමාජික |
|---|---|---|
| මාසික දීමනාව | රු.200,000.00 | රු.100,000.00 |
| මාසික ප්‍රවාහන දීමනාව/ වාහනය | වාහනය | නිල රාජකාරී සඳහා සහභාගි වීමට ප්‍රවාහන වියදම් සහ අනෙකුත් අනියම් වියදම් |
| මාසික ඉන්ධන සීමාව/ ලීටර් | ලීටර් 150 | - |
| මාසික සන්නිවේදන දීමනාව | ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීම | ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීම |

ඊට අනුකූලව, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 6(6) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට ඉහත සඳහන් පාරිශ්‍රමික සහ දීමනා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2026 නොවැම්බර් 17 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 නොවැම්බර් 30 සඳුදා)**

2254/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ඉන්දියාව සමඟ විදුලි, ඩිජිටල්, ඉන්ධන නළ මාර්ග සහ ප්‍රවාහන සම්බන්ධතා වර්ධනය කර ගැනීම සුදුසු බව පිළිගන්නේද;

(ii) එම අරමුණින් 2025.04.05 දින හෝ ඊට ආසන්න දිනයකදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ගිවිසුම මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂිත මූලික අරමුණු සහ ඉලක්ක කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ධනුෂ්කොඩි සහ තලෙයිමන්නාරම අතර පෝක් සමුද්‍ර සන්ධියේ උපායමාර්ගික යටිතල පහසුකම් කොරිඩෝව ඉදි කිරීමේ මෙතෙක් ලබා ඇති ප්‍රගතිය කවරේද;

(ii) කොටසක් ඉහළින් යන පාලමකින් සහ ඉතිරි කොටස මුහුදු යට උමඟකින් යුත් භෞතික සම්බන්ධතාවක් ගොඩ නැඟීම සඳහා මේ වනවිට ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සාකච්ඡාවක් ආරම්භවී තිබේද;

(iii) එම ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට ලැබෙන ද්විපාර්ශ්වික වාසි කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 01 අඟහරුවාදා)**

2464/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1AB, 1C, 2 සහ 3 වර්ගයේ පාසල් සඳහා අන්තර්ජාල, දුරකථන සහ විදුලි ගාස්තු වෙනුවෙන් අනුමත මාසික ප්‍රතිපාදනය;

(ii) 2022 සිට 2026 දක්වා ජාතික හා පළාත් පාසල් සඳහා එම සේවා වෙනුවෙන් වාර්ෂිකව වෙන් කළ ප්‍රතිපාදනය;

(iii) අනුමත ප්‍රතිපාදන ඉක්මවා ගාස්තු දැරීමට සිදුවූ පාසල් සංඛ්‍යාව සහ ඒ හේතුවෙන් ඇතිවූ මූල්‍ය හිඟය;

(iv) ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමෙන් හිඟ බිල්පත් ඇති හෝ විදුලිය ඇතුළු සේවා විසන්ධි කර ඇති පාසල් සංඛ්‍යාව;

පාසල් වර්ගය හා පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුමත ප්‍රතිපාදනය ඉක්මවන ගාස්තු ගෙවීමට බාහිර පාර්ශ්වවලින් මූල්‍යාධාර ලබාගැනීමට පාසල්වලට සිදුව තිබේද;

(ii) පරිගණක සහ සුහුරු පන්ති කාමර ඇතුළු අවශ්‍යතා සැලකිල්ලට ගෙන සේවා ගාස්තු සඳහා මේ දක්වා අනුමත ප්‍රතිපාදන සමාලෝචනය කර වැඩි කිරීමටත්, හිඟ ගාස්තු ගෙවීමේ වගකීම රජය භාර ගැනීමටත් පියවර ගන්නේද;

(iii) පාසල්වල විදුලි බිල්පත් අඩු කිරීම සඳහා සූර්ය පැනල සවි කිරීමේ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේ නම්, එහි කාලරාමුව සහ ප්‍රතිපාදන කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 02 බදාදා)**

2465/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ආයතනවල වෙබ් අඩවි, අන්තර්ජාල සේවා සහ දත්ත පද්ධති ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කළයුතු ප්‍රමිතීන්, මාර්ගෝපදේශ සහ අනිවාර්ය ක්‍රියාපටිපාටි කවරේද;

(ii) එම පද්ධති සඳහා සයිබර් ආරක්ෂණ තක්සේරු, ආරක්ෂණ දුර්වලතා ඇගයීම සහ ආක්‍රමණ පරීක්ෂණ සිදු කළයුතු කාල පරතරය කවරේද;

(iii) එම ඇගයීම් හා පරීක්ෂණ සිදු කිරීම සහ අධීක්ෂණය භාර ආයතන කවරේද;

(iv) ඇගයීම් හා පරීක්ෂණ මඟින් හඳුනාගන්නා බරපතළ හා අධි අවදානම් ආරක්ෂණ දුර්වලතා නිවැරදි කිරීම සඳහා ලබා දෙන කාලරාමුව කවරේද;

(v) එම දුර්වලතා නිවැරදි කළ බව තහවුරු කරන නැවත පරීක්ෂණ හා අධීක්ෂණ යාන්ත්‍රණය කවරේද;

(vi) නියමිත කාලය තුළ එම ආරක්ෂණ දුර්වලතා නිවැරදි කිරීමට අපොහොසත් වන රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 03 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1005/2025

ගරු මුජීබුර් රහුමාන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්තමාන සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම්;

(ii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් පහසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට සේවකයින්ට ගෙවා ඇති ප්‍රසාද දීමනාවල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ප්‍රසාද දීමනා ගෙවීමේදී සලකා බලන ලද නිර්ණායක කවරේද;

(iii) ඕන් ඉදිරියට ප්‍රසාද දීමනා ගෙවීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීමට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1226/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල්වල පහසුකම් අවම බව දන්නේද;

(ii) එසේ නම්, එම පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලසුම් සහ ඒවා ක්‍රියාත්මක කරන කාලරාමුව කවරේද;

(iii) පෙර පාසල්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම, විෂය නිර්දේශ සහ පරිපාලන කටයුතු නහාසිටුවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) පෙර පාසල්වල අධ්‍යාපනය, පෝෂණය සහ මහජන සෞඛ්‍ය සේවා සහතික කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෙර පාසල්වල මූලික පහසුකම් අවම වීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) පෙර පාසල් ගුරුවරුන් සහ සහායකයන් වෙත මාසික වැටුප්, දිරි දීමනා සහ ප්‍රතිලාභ විධිමත්ව ගෙවන්නේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) සියලුම පෙර පාසල් දරුවන්ට ප්‍රමිතියෙන් යුතු පෝෂ්‍යදායී ආහාර ප්‍රමාණවත්ව සහ විධිමත්ව ලබා දෙන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පෙර පාසල් සංවර්ධනය සඳහා රජයෙන් වෙන්කරන ප්‍රතිපාදන මුළුමනින්ම භාවිත කර තිබේද;

(ii) එසේ නම්, වෙන් කළ මුදල් ප්‍රතිපාදන සහ වියදම් පිළිබඳ දත්ත පවත්වාගෙන යන්නේද;

යන්න එතුමිය තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1508/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන 'නැගෙනහිර පළාත් නිවාස සංවර්ධන අධිකාරිය' 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම අධිකාරිය විසින් පළාත තුළ මේ වනවිට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) අධිකාරිය යටතේ සේවය කරන නිලධාරින්ගේ පත්වීම් දින සහ තනතුරු පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

(iv) එම නිලධාරින්ට ස්ථිර පත්වීම් ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1536/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථාන පිහිටි ස්ථාන කවරේද;

(iii) කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන පොලිස් ස්ථාන කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම කුලී ගොඩනැගිලි සඳහා වාර්ෂිකව ගෙවා ඇති කුලී මුදල් ප්‍රමාණය කොපමණද;

(v) පොලිස් ස්ථාන හැකිතාක් දුරට රජයේ ගොඩනැගිලි තුළ පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1648/2025

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂයේ මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල වී වගා කරන ලද ඉඩම් ප්‍රමාණය සහ අස්වැන්න එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කවල වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතින වැව්වල නම් සහ ඒවා යටතේ වගා කටයුතු සිදුකරන භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම වැව් අතරින් භාවිතයට නොගත් හෝ අත්හැර දමා ඇති වැව් තිබේද;

(iv) එසේ නම්, එම වැව්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කවල පිහිටා තිබෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මධ්‍යස්ථානවල පාලනය යටතේ පවතින දැනට භාවිතයේ ඇති සහ අත්හැර දමා ඇති වැව්වල නම් සහ ඒවා යටතේ ලියාපදිංචි කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iii) අත්හැර දමා ඇති වැව් අතරින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පවතින වැව් තිබේද;

(iv) එසේ නම්, එම වැව් කවරේද;

(v) එවැනි වැව් නැවත මහජන ප්‍රයෝජනය සඳහා මුදාහැරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 03 බ්‍රහස්පතින්දා)**

2466/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතන පවත්වාගෙන යන වෙබ් අඩවි, අන්තර්ජාල සේවා සහ දත්ත පද්ධති සංඛ්‍යාව කොපමණද;

(ii) පසුගිය වර්ෂ 05 තුළ සයිබර් ආරක්ෂණ තක්සේරු සිදු කළ රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම තක්සේරුවලින් බරපතළ හෝ අධි අවදානම් ආරක්ෂණ දුර්වලතා හඳුනාගත් වෙබ් අඩවි, අන්තර්ජාල සේවා සහ දත්ත පද්ධති සංඛ්‍යාව කොපමණද;

(iv) හඳුනාගත් එම දුර්වලතා අතරින් පූර්ණ වශයෙන් නිවැරදි කර ඇති සහ මෙතෙක් නිවැරදි කර නොමැති දුර්වලතා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 04 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1197/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි යා/ඩෙල්ෆ්ට් මංගයටිකරසි විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල අයත් වන පාසල් කාණ්ඩය කවරේද;

(iii) පාසලේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පවතින පුරප්පාඩු මෙතෙක් සම්පූර්ණ නොකිරීමට හේතු කවරේද;

(v) පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාලසීමාව කොපමණද;

(vi) ගුරු පුරප්පාඩු හේතුවෙන් එම පාසලේ අධ්‍යාපන කටයුතු සඳහා එල්ලවී ඇති බලපෑම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1686/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, වාන්ඇල ප්‍රදේශයේ 'කන්තලේ ඇළ මාර්ගය', 'වාන්ඇල ඇළ මාර්ගය' නමින් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම ඇළ මාර්ගය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල, ඉන් ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව සහ ජලය සැපයෙන කුඹුරු ප්‍රමාණය අක්කර කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ඇළ මාර්ගය වාන්ඇල මුස්ලිම් ජනපදයේ සිට තවත් කිලෝමීටර් 02ක් දීර්ඝ නොකිරීම හේතුවෙන් ගොවීන් විශාල පිරිසකට ජලය ලබා ගැනීමේදී දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ඇළ මාර්ගය කිලෝමීටර් 02කින් දීර්ඝ කිරීම සඳහා පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1965/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යාලිංගම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පවතින පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආයතනවල ස්ථාපිත කර ඇති ගිනි නිවීමේ ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) පළාත් පාලන ආයතනවල ගිනි නිවීමේ ඒකක ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය ලේඛනයක් හෝ මාර්ගෝපදේශ තිබේ නම්, සභාගත කරන්නේද;

(v) නොඑසේ නම්, එම ඒකක ස්ථාපිත කරනු ලබන පදනම කවරේද;

(vi) දැනට ස්ථාපිත කර ඇති ගිනි නිවීමේ ඒකක අතරින් පූර්ණ ධාරිතාවෙන් ක්‍රියාත්මක කළ හැකි ඒකක සංඛ්‍යාව කොපමණද;

(vii) එලෙස ක්‍රියාත්මක කළ නොහැකි ඒකක තිබේ නම්, ඊට හේතු කවරේද;

(viii) ඉදිරියේදී ගිනි නිවීමේ ඒකක ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2573/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා දුම්රිය ස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීමට ප්‍රමුඛතාව ලබා දිය යුතු බවට හඳුනාගෙන ඇති ව්‍යාපෘති කවරේද;

(ii) ඒවායේ වත්මන් ප්‍රගතිය කවරේද;

(iii) ශ්‍රවණාබාධ සහිත මගීන්ට දුම්රිය ප්‍රමාදවීම්, වේදිකා වෙනස්වීම් සහ කාලසටහන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම සඳහා සංඥා පුවරු සහ නවීන තාක්ෂණය භාවිත කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආබාධ සහිත පුද්ගලයන්ගේ දුම්රිය ගමන් පහසු කිරීම සඳහා සියලු ආකාරයේ ආබාධ සහිත පුද්ගලයන්ට භාවිත කළ හැකි ඩිජිටල් යෙදුමක් හඳුන්වාදීමට පියවර ගන්නේද;

(ii) දුම්රිය ස්ථානවල වැසිකිලි, විවේකාගාර, ආපනශාලා සහ නවාතැන් පහසුකම් භාවිත කිරීමේදී ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) ආබාධ සහිත මගීන්ට සහාය සැපයීම සඳහා දුම්රිය ස්ථානවල සහායක සේවා මධ්‍යස්ථාන පිහිටුවීමට හැකියාව තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2618/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් ඩිපෝවල නම් කවරේද;

(iii) මාසිකව ලාභ ලබන සහ පාඩු ලබන ඩිපෝ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පාඩු ලබන ඩිපෝ ලාභ ලබන තත්ත්වයට පත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෛනිකව ක්‍රියාත්මක කිරීමට නියමිත බස් ධාවන වාර සංඛ්‍යාව;

(ii) රියදුරන් හා කොන්දොස්තරවරුන් නොමැති වීම, ටයර් හිඟය, අමතර කොටස් හිඟය සහ බස් රථ හිඟය හේතුවෙන් නවතා ඇති බස් ධාවන වාර සංඛ්‍යාව;

එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) හිඟව පවතින ඩිසෝ සඳහා ටයර් හා අමතර කොටස් ලබා දීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 04 සිකුරාදා)**

2477/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාවට වෝටර් ජෙල් පුපුරණ ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 287,170ක් මිලදී ගැනීමේ ටෙන්ඩරය විවෘත කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා ලංසු ඉදිරිපත් කළ ආයතන කවරේද;

(iii) Bairstow Eves (Pvt) Ltd සමාගම ජයග්‍රාහකයා ලෙස තෝරාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ආයතනය නියමිත දිනට සාම්පල ඉදිරිපත් කිරීමට අපොහොසත්වූ බවත්;

(ii) 2026.08.25 දින නැවත දින 07ක කාලයක් ලබා දුන් බවත්;

(iii) එම කාලය තුළද සාම්පල ඉදිරිපත් නොකළ බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) Addendum No. 1 – MOD/SLN/03/2025 අනුව සාම්පල ඉදිරිපත් කිරීමේ උපරිම කාලය දින 14ක් පමණක් වන්නේද;

(ii) එසේ නම්, ප්‍රසම්පාදන රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය කළ සමාගමකට අයුතු වාසි ලබාදී ඇත්නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) සැපයුම්කරු තෝරා ගැනීමේ ඇගයීම් නිර්ණායක කවරේද;

(ii) අනෙකුත් ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතු කවරේද;

(iii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 05 සෙනසුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2283/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඔරුවල වානේ කර්මාන්තශාලාව ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) එම කර්මාන්තශාලාව ආරම්භ කිරීමේදී පැවැති ප්‍රධාන ජාතික සහ ආර්ථික අරමුණු කවරේද;

(iii) කර්මාන්තශාලාව පෞද්ගලිකරණය කිරීමට තීරණය කළ වර්ෂය සහ ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාපටිපාටිය කවරේද;

(iv) මේ වනවිට මෙම කර්මාන්තශාලාවේ හිමිකාරිත්වය සහ පාලනය පවතින ආයතනය හෝ පුද්ගලයා කවරේද;

(v) කර්මාන්තශාලාවේ හිමිකාරිත්වය පැවරීමේදී අනුගමනය කළ ක්‍රියාපටිපාටිය කවරේද;

(vi) එම පැවරීමෙන් රජයට ලැබුණු මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2486/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පාසල්වල සහ පළාත් සභා පාසල්වල මේ වනවිට සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික පාසලක ගුරුවරයෙකු පළාත් සභා පාසලකටත්, පළාත් සභා පාසලක ගුරුවරයෙකු ජාතික පාසලකටත් ස්ථාන මාරු ලබාගැනීම සඳහා පවතින ක්‍රමවේදය කවරේද;

(iii) දැනට පවතින ක්‍රමවේදය සංකීර්ණ බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය සරල කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2518/2026

ගරු සුරංග රත්නායක මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරොව්පතාන රෝහල B ශ්‍රේණියේ රෝහලක් බවත්;

(ii) එය ප්‍රදේශයේ ජනතාවට සේවා සපයන ප්‍රධාන රෝහලක් වන අතර, දෛනිකව විශාල රෝගීන් සංඛ්‍යාවක් බාහිර හා නේවාසික ප්‍රතිකාර සඳහා පැමිණෙන බවත්;

(iii) එම රෝහලේ ප්‍රමාණවත් ළමා ප්‍රතිකාර හා ළමා වාට්ටු පහසුකම් නොමැති බවත්;

(iv) එම රෝහලේ සේවය කරන වෛද්‍යවරුන් සඳහා ප්‍රමාණවත් නිල නිවාස නොමැති බවත්;

(v) ඒ හේතුවෙන් වෛද්‍යවරුන්ට විවිධ අපහසුතාවලට මුහුණදීමට සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා සැලකිල්ලට ගෙන එම රෝහල උත්ශ්‍රේණිගත කිරීමට රජයේ අවධානය යොමුවී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) රෝහල උත්ශ්‍රේණිගත කරන්නේ නම්, එම ශ්‍රේණියට අදාළ පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම සංවර්ධන කටයුතු ආරම්භ කර අවසන් කිරීමට අපේක්ෂිත කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2572/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුකරයේ නව විදුලි සම්බන්ධතා ලබා ගැනීමේදී හෝ විදුලි ගිණුම්වල නම් වෙනස් කිරීමේදී වතු අධිකාරිවරයාගේ නිර්දේශය ලබාගැනීමට සිදුවන බවත්;

(ii) විදුලි සම්බන්ධතා සඳහා වතු භූමිය තුළ විදුලි කණු ස්ථාපිත කිරීමට සිදුවන අවස්ථාවල වතු හිමියන් ඊට විරෝධය පළ කරන බවත්;

(iii) වතුකරයෙන් බැහැර ප්‍රදේශවල විදුලි සම්බන්ධතා ලබා ගැනීමේදී ග්‍රාම නිලධාරිගේ නිර්දේශය පමණක් ප්‍රමාණවත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටළු නිරාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2619/2026

ගරු සුජීව දිසානායක මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආගමික ආයතන පදනම් කරගෙන සූර්ය විදුලි පැනල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ආරම්භ කළ වර්ෂය කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ආධාර ලබා දුන් රට කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ 2026.06.30 දිනය වනවිට පහසුකම් සැපයීමට නියමිතව තිබූ ආගමික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වෙන් කර තිබූ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ 2026.06.30 දිනය වනවිට සූර්ය විදුලි පැනල පද්ධති ලැබී නොමැති ආගමික ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 05 සෙනසුරාදා)**

2478/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා සතොස සේවකයන්ගේ සමුපකාර සකසුරුවම්, සුභසාධක සහ ණය දෙන සමිතියට අයත් කතරගම නිවාඩු නිකේතන ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කර ඇති තැනැත්තන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තැනැත්තන් විසින් එම ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කර ඇති මුළු මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතියේ වර්තමාන වටිනාකම කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය නතර කිරීමට තීරණය කර තිබේද;

(v) නොඑසේ නම්, ඉදිරියේදී එය පවත්වාගෙන යාමට අදාළ ප්‍රතිපත්තිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතිය සඳහා —

(i) එම්.ඩී. චන්ද්‍රලතා දයාවති (සේවක අංක 10405), එස්.කේ.එම්.පී. කරුණාරත්න (සේවක අංක 12583), ඩබ්ලිව්.සී.එන්. අබේසේකර (සේවක අංක 13529) සහ කේ.පී.ඩී. බන්දුල නන්ද (සේවක අංක 11629) යන සේවකයන් විසින් ආයෝජනය කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයෝජන සුරක්ෂිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 07 සඳුදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2211/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට සේවක අර්ථසාධක අරමුදලට හිඟ මුදල් ගෙවීමට ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් සහ ලිපින කවරේද;

(iii) ගෙවීමට ඇති හිඟ මුදල් ප්‍රමාණය එක් එක් රාජ්‍ය ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම මුදල් අයකර ගැනීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2482/2026

ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නියඟයෙන් පීඩාවට පත් ජනතාවට පානීය ජලය සැපයීම සඳහා ගෙන ඇති කඩිනම් පියවර කවරේද;

(ii) වැව්, ජලාශ සහ භූගත ජල සම්පත්වල වර්තමාන තත්ත්වය තක්සේරු කර තිබේද;

(iii) ඉදිරි මාසවලදී පානීය ජලය සහ කෘෂිකාර්මික ජල අවශ්‍යතා සපුරාලීමට ගන්නා පියවර කවරේද;

(iv) නියඟයෙන් සිදුවූ වගා හා ආර්ථික හානි පිළිබඳ දිස්ත්‍රික් මට්ටමින් තක්සේරු කර තිබේද;

(v) පීඩාවට පත් ගොවීන්ට වන්දි හෝ මූල්‍යාධාර ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) සුළු පරිමාණ ගොවීන්ගේ සහ කිරි ගොවීන්ගේ ජීවනෝපාය ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 'එල් නිනෝ තත්ත්වය' සහ අනාගත නියං තත්ත්වයන්ට මුහුණදීම සඳහා ජාතික සැලැස්මක් රජය සතුව තිබේද;

(ii) වාරිමාර්ග සංවර්ධනය, වැසි ජලය රැස් කිරීම සහ ජල සම්පත් සුරක්ෂිත කිරීම සඳහා කර ඇති ආයෝජන කවරේද;

(iii) අනාගත නියං තත්ත්වයන්ට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සඳහා ජාතික පූර්ව අනතුරු ඇඟවීමේ සහ හදිසි ප්‍රතිචාර යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2547/2026

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මුලු භූමි ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(ii) එම භූමි ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණයෙන් නිරවුල්ව ඇති ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2598/2026

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා සුළු පරිමාණ කර්මාන්ත ශාලා සංඛ්‍යාව;

(ii) ඒ අතරින් රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් කර්මාන්ත ශාලා සංඛ්‍යාව;

(iii) එම කර්මාන්ත ශාලාවල සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල මේ වනවිට ක්‍රියාත්මක මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා සුළු පරිමාණ කර්මාන්ත ශාලා සංඛ්‍යාව එක් එක් පළාත අනුව;

(ii) එම කර්මාන්ත ශාලාවල සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව;

(iii) මඩකලපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර දිස්ත්‍රික්කවල පිහිටි කර්මාන්තශාලා සංඛ්‍යාව සහ ඒවායේ සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උතුරු සහ නැගෙනහිර පළාත්වල කර්මාන්ත ශාලා සංඛ්‍යාව සහ ඒවායේ සේවකයන් සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ සමස්ත කර්මාන්ත ශාලා සංඛ්‍යාවේ සහ සමස්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2655/2026

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාර්ෂිකව ආයුර්වේද රෝහල් සඳහා වෛද්‍යවරුන් සහ රෝහල් සහායකයින් බඳවා ගනු ලබන්නේද;

(ii) එසේ නම්, බඳවා ගනු ලබන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ ආයුර්වේද රෝහල් සඳහා වාර්ෂිකව ප්‍රාග්ධන හා නඩත්තු වියදම් වෙනුවෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) ආයුර්වේද රෝහල් සතු ගිලන් රථ සංඛ්‍යාව කොපමණද;

(v) පාරම්පරික දේශීය වෛද්‍ය උරුමය සංරක්ෂණය කරමින්, සුදුසුකම් සලකා බලා, දේශීය වෛද්‍යවරුන්ට විධිමත් හා නීත්‍යානුකූල ලෙස වෘත්තියේ නියැළීම සඳහා අවස්ථාව ලබාදීමට අදාළව ක්‍රියාත්මක වන නියාමන ව්‍යුහය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 07 සඳුදා)**

2502/2026

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 55 වැනි පිටුවෙහි සඳහන් 'මොනරුන්, රිලවුන්, දඩුලේනුන් වැනි වගාවන්ට හානි පමුණුවන වන සතුන්ගේ වර්ධනය පිළිබඳ නිවැරදි අධ්‍යයනයක් සිදු කර ජීව විද්‍යාත්මක ක්‍රමවේද මඟින් ගහනය පාලනය කිරීමට පියවර' යන යෝජනාව, 2026.09.01 දිනය වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 08 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

37/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2018 වර්ෂයේ සිට මේ දක්වා —

(i) ශ්‍රී ලංකාවට ගෑස් ආනයනය කරන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම් සහ ප්‍රධාන කොටස්කරුවන්ගේ නම් කවරේද;

(iii) ආනයනය කර ඇති ගෑස් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ගෑස් මෙරට වරාය වෙත පැමිණීමේදී මිල සහ දේශීය වෙළෙඳපොළ තුළ අලෙවි කරන ලද මිල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ගෑස් සඳහා අය කරන ලද බදු වර්ග සහ ඒවායේ ප්‍රමාණ වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමාගම් 02ක් විසින් එකම ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර වෙනස් මිල ගණන් යටතේ අලෙවි කිරීම සිදු කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

143/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා සිදුවූ ඇතැම් අපරාධ සිදුවීම් කාලයත් සමඟ යටපත් වන ස්වභාවයක් පවතින බවත්;

(ii) එවැනි සිදුවීම් පිළිබඳව නැවත පරීක්ෂණ ආරම්භ කරන බවට වර්තමාන රජය විසින් ප්‍රකාශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හඳුනාගත් එවැනි අපරාධ සිදුවීම් සංඛ්‍යාව සහ ඒවායේ ස්වරූපය කවරේද;

(ii) එම සිදුවීම් සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2353/2026

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතෙන් අනෙකුත් පළාත්වලටත්, අනෙකුත් පළාත්වලින් උතුරු පළාතටත් ස්ථාන මාරුවීම් ලබා වර්ෂ 10කට වැඩි කාලයක් සේවය කළද, තමන්ගේ මුල් පළාත් වෙත යළි ස්ථාන මාරුවීම් ලබා ගැනීමට නොහැකිව සිටින ගුරුවරුන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමුවී තිබේද;

(ii) එම ගුරුවරුන්ගේ දිගු කාලීනව පවුලෙන් වෙන්ව සිටීම, මානසික යහපැවැත්ම, ඉගැන්වීමේ කාර්ය සාධනය සහ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි ඇති කරන බලපෑම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) සේවා අවශ්‍යතා සහ පාසල්වල ගුරු හිඟය සැලකිල්ලට ගනිමින්, මානුෂීය පදනම මත එම ගුරුවරුන්ට තම මුල් පළාත් වෙත ස්ථාන මාරුවීම් ලබා දීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2553/2026

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1968 වර්ෂයට පෙර සිටම අම්පාර දිසාපතිවරයා විසින් තිරුකෝවිල්, වට්ටමඩු තෘණ භූමිය ගවයන් සඳහා තෘණ භූමියක් ලෙස වෙන් කර තිබූ බවත්;

(ii) අම්පාර දිස්ත්‍රික්කයේ සමස්ත ගවයන්ගෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයක්, එම තෘණ භූමිය භාවිත කරන බවත්;

(iii) ගවයන් සඳහා එම තෘණ භූමිය භාවිත කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අවසර ලබා නොදෙන බවත්;

(iv) ගව පාලනය ජීවනෝපාය කරගත් කිරි ගොවීන් 10,000කට අධික පිරිසකගේ ජීවනෝපායට සහ රටේ කිරි නිෂ්පාදනයට එම තත්ත්වය බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ගවයන් සඳහා ලබා දෙනු ලබන විකල්ප තෘණ භූමි කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මයිලත්තමඩු–මාධවනෙ තෘණ භූමිවල නීති විරෝධී වගා කටයුතු සිදු වන බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් ලබාදී ඇති තීන්දුව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2629/2026

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ පාසල් පද්ධතිය තුළ ගුරු උපදේශකවරුන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම දිස්ත්‍රික්කය සඳහා අනුමත ගුරු උපදේශකවරුන් සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කලාපය සහ විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිස්ත්‍රික්කයේ ගුරු උපදේශක පුරප්පාඩු ඇතිවීමට බලපා ඇති ප්‍රධාන හේතු කවරේද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර සහ ඉදිරියේදී ගැනීමට නියමිත නිශ්චිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 08 අඟහරුවාදා)**

2514/2026

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික විගණන කාර්යාල වාර්තාවකට අනුව, 2025 වර්ෂයේදී දිවයින පුරා පිහිටි ජනාධිපති මන්දිරවල ජනාධිපතිවරයා නවාතැන් නොගත්තද, ඉන් බොහොමයක වෙනත් පුද්ගලයන් 3,089 දෙනෙකු නවාතැන් ගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එලෙස නවාතැන් ගෙන ඇති පිරිස කවුරුන්ද;

(iii) ජනාධිපතිවරයා පරිහරණය නොකළ එම මන්දිරවල විදුලිය, දුරකථන හා අනෙකුත් උපයෝගිතා පහසුකම් සඳහා 2025 වර්ෂයේදී රුපියල් මිලියන 33.5කට ආසන්න මුදලක් වැය කර තිබේද;

(iv) එසේ නම්, එම වියදම් දැරීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කතරගම, මහියංගනය සහ බෙන්තොට ජනාධිපති මන්දිරවල කිසිදු රැස්වීමක් හෝ නවාතැන් ගැනීමක් සිදු නොවී තිබියදීත්, ඒවායේ නඩත්තු කටයුතු සඳහා රුපියල් මිලියන 2.5කට ආසන්න මුදලක් වැය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු කවරේද;

(iii) කොළඹ කොටුව සහ මහනුවර මන්දිර හැර සෙසු ජනාධිපති මන්දිර ආර්ථිකමය වශයෙන් ඵලදායි කාර්යයන් සඳහා යොදා ගැනීමට රජය සැලසුම් කරන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රියාවලිය ආරම්භ කිරීමට අපේක්ෂිත කාලසීමාව කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 09 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

727/2025

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් ලිමිටඩ් විසින් වී තොග ගබඩා කිරීම සඳහා පිලිපිනයෙන් ආනයනය කරන ලද ජංගම ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගබඩා සඳහා වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) මෙම ගබඩා රජයේ ආයතන වෙත නොමිලේ ලබාදී ඇති බව දන්නේද;

(iv) එලෙස නොමිලේ ලබාදීමට බලපාන ලද සාධක කවරේද;

(v) ජංගම ගබඩාවලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

992/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් නිෂ්පාදනය කරන ලද කිරිපිටි සහ යෝගට් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ එහි වාර්ෂික ලාභය/අලාභය කවරේද;

(iii) මේ වනවිට එම ආයතනයේ මූලස්ථානය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය කවරේද;

(iv) එම ගොඩනැගිල්ල සඳහා මාසිකව හා වාර්ෂිකව ගෙවනු ලබන කුලිය කොපමණද;

(v) මූලස්ථානය රජයේ ගොඩනැගිල්ලකට ගෙන යාම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2047/2026

ගරු ඝානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගැසට් නිවේදන මඟින් මඩකලපුව දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ආරක්ෂිත ස්ථාන ලෙස ප්‍රකාශයට පත්කර ඇති ස්ථාන කවරේද;

(ii) එම එක් එක් ස්ථානයට අදාළව ප්‍රකාශයට පත්කර ඇති ගැසට් නිවේදනවල අංක කවරේද;

(iii) එම ස්ථාන සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා රජය සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලෙයිපත්තුව දකුණ (කිරාන්) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නෙළුගල (නෙල්කල් මලෙයි) පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු ස්ථානයක් බව දන්නේද;

(ii) එම ප්‍රදේශයේ නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දුන් අධිකාරිය හෝ ආයතනය කවරේද;

(iii) මන්මුනෙ නිරිතදිග (පට්ටිපලෙයි) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තාන්දාමලෙයි මුරුගන් කෝවිලේ සංවර්ධන කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් තහනම් කිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2402/2026

ගරු තිළිණ සමරකෝන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු සංචාරක බංගලා සංඛ්‍යාව කොපමණද;

(ii) කලා වැව් බැම්ම මත අධිකාරිය සතු සංචාරක බංගලාවක් තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට එය ක්‍රියාත්මක වන්නේද;

(iv) එම බංගලාවේ මේ වනවිට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2025 සහ 2026 කාලසීමාව තුළ —

(i) එම බංගලාවේ සේවකයන් සඳහා වැටුප් වශයෙන් ගෙවා ඇති මුදල;

(ii) බංගලාවේ ජල, විදුලි, දුරකථන සහ අන්තර්ජාල බිල්පත් සඳහා ගෙවා ඇති මුදල;

(iii) නවාතැන් ගත් පුද්ගලයන් වෙනුවෙන් දරා ඇති මුළු වියදම;

(iv) ආයතනික කටයුතු සඳහා එහි කාමර හෝ සම්පූර්ණ පරිශ්‍රය භාවිතා කර ඇති දින ගණන සහ එමඟින් ඉපැයූ ආදායම;

(v) බාහිර පුද්ගලයන්, සංවිධාන හෝ ආයතන විසින් කාමර හෝ සම්පූර්ණ පරිශ්‍රය භාවිතා කර ඇති දින ගණන සහ එමඟින් ඉපැයූ ආදායම;

(vi) බංගලාවේ නඩත්තු සහ ඉදිකිරීම් සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත කාලසීමාව තුළ ආයතනික කටයුතු හෝ බාහිර පුද්ගලයින්, සංවිධාන හෝ ආයතන විසින් සංචාරක බංගලාව යොදාගෙන ඇති කාර්යයන් කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2510/2026

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන බොහොමයක දරුවන්ගේ ආරක්ෂාව, පෝෂණය සහ මනෝ විද්‍යාත්මක සංවර්ධනය සඳහා අවශ්‍ය අවම පහසුකම් පවා නොමැති බවත්;

(ii) කාර්ය මණ්ඩලයේ සුදුසුකම් සම්බන්ධයෙන් පරීක්ෂණ ක්‍රමවේදයක් නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ක්‍රියාත්මක වන පෙර පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ජාතික ප්‍රමිතීන්ට අනුව ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(ii) සියලුම පෙර පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන අනිවාර්යයෙන් ලියාපදිංචි කිරීම, දරුවන් රැකබලා ගන්නා කාර්ය මණ්ඩලයට ළමා ආරක්ෂාව සහ ප්‍රථමාධාර පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදීම සහ එම ආයතනවල ප්‍රමිතීන් පරීක්ෂා කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ස්වාධීන අධීක්ෂණ කණ්ඩායම් පත් කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 09 බදාදා)**

2530/2026

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ —

(i) රජයේ සහ සමස්ත රාජ්‍ය අංශයේ සිටින මුළු සේවකයන් සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සේවක සංඛ්‍යාව කම්කරු/සුළු සේවක, ලිපිකරු, තාක්ෂණ/වෘත්තීය සහ විධායක/කළමනාකරණ යන සේවක කාණ්ඩ අනුව වාර්ෂිකව කොපමණද;

(iii) වැටුප්, වේතන, දීමනා, අතිකාල දීමනා සහ අනෙකුත් සේවා නියුක්ති පිරිවැය සඳහා දැරූ වියදම එක් එක් සේවක කාණ්ඩය අනුව සහ සාමාන්‍ය ඒක පුද්ගල පිරිවැය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි සහ වැටුප් බිල්පතෙහි වාර්ෂික වෙනස්වීම් කවරේද;

(v) රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව සේවා නියුක්ත ජනගහනයේ සහ ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(vi) රාජ්‍ය අංශයේ වැටුප් බිල, පුනරාවර්තන වියදමෙහි, රාජ්‍ය ආදායමෙහි සහ දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඵලදායිතාව, පෞද්ගලික අංශයේ ශ්‍රම සැපයුම, රාජ්‍ය මූල්‍යය සහ ආර්ථික වර්ධනය කෙරෙහි රාජ්‍ය අංශයේ බලපෑම රජය තක්සේරු කර තිබේද;

(ii) එසේ නම්, යෝජිත ප්‍රතිසංස්කරණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 10 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

372/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රට පුරා එක්වරම කාබනික ගොවිතැනට යොමු කිරීම සඳහාවූ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට රජයට උපදෙස් දුන් නිලධාරීන් සහ ඔවුන් දැරූ තනතුරු කවරේද;

(ii) එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම නිසා රටට සිදුවූ හානිය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) ඔවුන්ට එරෙහිව අපරාධ නීතිය අනුව ගෙන ඇති පියවර කවරේද;

(iv) එම නිලධාරින්ගෙන් වන්දි අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

476/2025

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටේ මුළු පානීය ජල අවශ්‍යතාවය, පසුගිය වර්ෂ 05 සඳහා වාර්ෂික ජල භාවිතය සහ ඉදිරි වර්ෂ 10 සඳහා අපේක්ෂිත පානීය ජල අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජල සැපයුම සඳහා භාවිතා කරන ජලාශ සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iii) සපයනු ලබන ජල ප්‍රමාණය එක් එක් ජලාශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජල සැපයුමේ ඇති විය හැකි යම් හිඟයක් විසඳීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) පසුගිය වර්ෂ 05 තුළ ජලය ලීටරයකට නිෂ්පාදන පිරිවැය, ලීටරයකට විකුණුම් මිල සහ ලීටරයක විකුණුම් වටිනාකම මත පැනවූ බදු ප්‍රමාණ මේ දක්වා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මුළු සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(vii) මණ්ඩලයේ වැටුප් හා වේතන සඳහා මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රට තුළ මුහුදු ජල ලවණහරණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම මධ්‍යස්ථානයන්හි නම් කවරේද;

(iii) එම එක් එක් මධ්‍යස්ථානයෙහි ලීටරයකට නිෂ්පාදන පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

711/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව උපයා ගන්නා ලද ආයෝජන ආදායම්වල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආදායම් උපයා ගන්නා ලද ආයෝජන මූලාශ්‍ර කවරේද;

(iii) එම ආයෝජන ආදායම්වල වටිනාකම මත ගෙවිය යුතු බදු මුදල කොපමණද;

(iv) එම මුදලෙන් මේ වනවිට ගෙවා ඇති බදු මුදල සහ ගෙවීමට ඇති බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1048/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ SAP පරිගණක පද්ධතිය සවි කරන ලද දිනය කවරේද;

(ii) ඒ සඳහා වැයවූ මුදල කොපමණද;

(iii) එම පරිගණක පද්ධතියේ දත්ත උපස්ථ පද්ධතිය (Data Backup) සවි කරන ලද දිනය කවරේද;

(iv) ඒ සඳහා වැයවූ මුදල කොපමණද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා පරිගණක පද්ධති සවි කරන ලද අවස්ථා ගණන සහ එක් එක් අවස්ථාවේදී වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම කාලසීමාව තුළ එක් එක් ප්‍රසම්පාදන පටිපාටි අවස්ථාවලදී ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන/පුද්ගලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) SAP පරිගණක පද්ධතියේ වර්තමාන ක්‍රියාකාරිත්වය කවරේද;

(ii) මෙම සමාගම සම්බන්ධයෙන් සිදු කරන ලද වෝහාරික විගණන වාර්තාව සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1801/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 'සැලසුම් අධ්‍යක්ෂ' තනතුර පුරප්පාඩුවී තිබුණේද;

(ii) මේ වනවිට එම පුරප්පාඩුව සඳහා පත්වීමක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම පත්වීම සිදු කිරීමේදී අදාළ බඳවාගැනීමේ පටිපාටිය අනුගමනය කර තිබේද;

(iv) එලෙස පත් කර ඇති සැලසුම් අධ්‍යක්ෂකවරයාගේ සේවා කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 10 බ්‍රහස්පතින්දා)**

2531/2026

ගරු රවී කරුණානායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ සිට මේ දක්වා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ සංස්ථාගත කර ඇති සමාගම් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට සක්‍රිය සහ අක්‍රිය ලෙස වර්ගීකරණය කර ඇති සමාගම් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සමාගමක් අක්‍රිය ලෙස වර්ගීකරණය කිරීමට භාවිතා කරනු ලබන නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 10 තුළ —

(i) ඇවර කිරීමේ, වසා දැමීමේ, බංකොලොත්භාවයට හෝ වෙනත් විධිමත් අවසන් කිරීමේ ක්‍රියාදාමයන්ට යොමුවූ සමාගම් සංඛ්‍යාව;

(ii) එවැනි ක්‍රියාදාමයන් පිළිබඳව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දුන් සමාගම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය සඳහා කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමාගමක් සංස්ථාගත කිරීම සඳහා මේ වනවිට ගතවන සාමාන්‍ය කාලය සහ උපරිම කාලය කොපමණද;

(ii) වාර්ෂික ප්‍රකාශයන් ඉදිරිපත් කර ඇති, ඉදිරිපත් කිරීමට අපොහොසත්වී ඇති සහ ඉදිරිපත් කිරීමේදී හිඟ තබා ඇති ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව කොපමණද;

(iii) අඛණ්ඩව වාර්ෂික ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමට අපොහොසත් සමාගම්වලට එරෙහිව ගෙන ඇති හෝ ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 11 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1042/2025

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ට තමන් සේවය කරන පාසලට හෝ වෙනත් රජයේ පාසලකට සිය දරුවන් ඇතුළත් කිරීම සඳහා මීට පෙර අවස්ථාව ලබාදී තිබූ බව දන්නේද;

(ii) එම පහසුකම වර්තමාන රජය විසින් චක්‍රලේඛයක් හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ගයක් මඟින් ඉවත් කර හෝ සංශෝධනය කර තිබේද;

(iii) අදාළ පහසුකම නැවත ලබාදීමට අදහස් කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1357/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ අරමුණු කවරේද;

(ii) අධිකාරිය විසින් මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලබන එක් එක් සංවර්ධන ව්‍යාපෘතියේ නම සහ ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ව්‍යාපෘති අතරින් මඩකලපුව මහ නගර සභාව, කාත්තන්කුඩි හා එරාවුර් නගර සභා සීමා තුළ ක්‍රියාත්මක කර ඇති එක් එක් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය, ව්‍යාපෘතියේ ස්වභාවය, ව්‍යාපෘතියේ අරමුණ, වැය කරන ලද මුදල සහ ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (iii)හි සඳහන් ප්‍රදේශ තුළ 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති කවරේද;

(v) එම ව්‍යාපෘති සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1384/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු ගංවතුර තත්ත්වයක් යටතේ වුවද අකුරණ නගරය ජලයෙන් යටවන බවත්;

(ii) මේ හේතුවෙන් අකුරණ ප්‍රදේශවාසීන් දැඩි දුෂ්කරතාවලට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අකුරණ නගරයේ ගංවතුර පාලනය සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව සහ ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) නගරය ජලයෙන් යටවීමට බලපා ඇති සාධක කවරේද;

(iii) එම ගැටලුවට තිරසර විසඳුමක් ලබාදීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1982/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දම්පහල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, උෆරුබොක්ක හීගොඩ රෝහලට යාබදව අමාත්‍යාංශය සතුව අක්කර දෙකක පමණ ඉඩමක් පවතින බවත්;

(ii) ගම්සභා උසාවි ක්‍රමය අහෝසි කිරීමෙන් පසුව එම භූමිය භාවිතයට නොගෙන පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉඩම ප්‍රාදේශීය ලේකම්වරයා වෙත හෝ වෙනත් රාජ්‍ය ආයතනයක් වෙත පවරා දීම සඳහා කටයුතු කර තිබේද;

(ii) නොඑසේ නම්, එම ඉඩම පොදු ප්‍රයෝජනය සඳහා හෝ උෆරුබොක්ක හීගොඩ රෝහලේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට පියවර ගන්නේද;

(iii) එම ඉඩමේ වර්තමාන නීතිමය තත්ත්වය සහ අපේක්ෂිත භාවිතය පිළිබඳ වාර්තාවක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2569/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ මේ වනවිට හඳුනාගෙන ඇති වනජීවී කලාප කවරේද;

(ii) එම වනජීවී කලාපවලට අයත් භූමි ප්‍රමාණය එක් එක් කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කලාප අතරින් ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කර ඇති කලාප කවරේද;

(iv) අභයභූමි ලෙස ප්‍රකාශයට පත් කර ඇති භූමි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දිස්ත්‍රික්කයේ යෝජිත අලිමංකඩ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කර ඇති අලිමංකඩ සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 11 සිකුරාදා)**

2532/2026

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අයිස්ක්‍රීම් සහ ශීත කළ අතුරුපස නිෂ්පාදකයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ වාර්ෂික නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ අපනයන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක විදේශීය හිමිකාරිත්වය සහිත/බලයලත් අයිස්ක්‍රීම් සහ මෘදු අයිස්ක්‍රීම් අලෙවිසැල් හා කියෝස්ක් සංඛ්‍යාව සහ එක් එක් වෙළෙඳ නාමය යටතේ ඇති අලෙවිසැල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපාරිකයන් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබා ගැනීමටත් අදාළ අවස්ථාවලදී එකතු කළ අගය මත බද්ද හා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වන්නේද;

(iv) ආනයනය කර ඇති නිමි අයිස්ක්‍රීම් නිෂ්පාදන, පෙර මිශ්‍රණ සහ අමුද්‍රව්‍ය ප්‍රමාණ හා වටිනාකම් සහ ඒවාට අදාළ ආනයන බදු, බදු සහන හා වෙනත් දිරිගැන්වීම් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) විදේශීය බලයලත් ව්‍යාපාර දේශීය නිෂ්පාදකයන්ට, සේවා නියුක්තියට, කිරි ගොවීන්ට, දේශීය අගය එකතු කරන්නන්ට සහ අපනයනයට ඇති කරන බලපෑම් ඇගයීමට ලක් කර තිබේද;

(vi) එසේ නම්, දේශීය නිෂ්පාදනය ආරක්ෂා කිරීමට සහ අපනයන ප්‍රවර්ධනය කිරීමට ගෙන ඇති/ගැනීමට යෝජිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 12 සෙනසුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1006/2025

ගරු මුජීබුර් රහුමාන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා දෙහිවල විවිධ සේවා සමූපකාර සමිතියේ සමූපකාර ග්‍රාමීය බැංකුව මඟින් නිකුත් කර ඇති ණය මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ණය ලබාගත් පුද්ගලයන්ගේ නම් සහ ණය මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ණය මුදල්වලින් මේ දක්වා අය කරගෙන ඇති සහ අය කරගෙන නොමැති මුදල කොපමණද;

(iv) අය කරගෙන නොමැති ණය මුදල් අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) මේ වනවිට එම බැංකුව බංකොලොත්වී තිබේද;

(vi) එසේ නම්, එහි සේවයේ නියුතු වැටුප් ලබන සේවකයන්ගේ නම්, තනතුරු සහ වැටුප් ප්‍රමාණ කවරේද;

(vii) බංකොලොත් වීම හේතුවෙන් තැන්පත්කරුවන්ට සිදුව ඇති බලපෑම් අවම කිරීම සහ ඔවුන්ගේ තැන්පතු සම්බන්ධ ගැටලු විසඳීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1324/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ආයතනවල සහ පාසල්වල පුස්තකාලයාධිපති සහ ඒ ආශ්‍රිත තනතුරු රාශියක් පුරප්පාඩුවී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පුරවා නොමැති වීමට හේතු කවරේද;

(iii) එම තනතුරු පිරවීම සඳහා තිබෙන සැලසුම් හෝ කාල රාමු කවරේද;

(iv) සුදුසු පුද්ගලයින් බඳවාගැනීමට හෝ උසස් කිරීමට පියවර ගන්නේද;

(v) රැකියා විරහිතව සිටින පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව කොපමණද;

(vi) ඔවුන් පුස්තකාලයාධිපති, ලේඛනාරක්ෂක නිලධාරීන් හෝ තොරතුරු නිලධාරීන් ලෙස පත් කිරීමට ගෙන ඇති පියවර මොනවාද;

(vii) ඔවුන්ට පුහුණුවක් හෝ තාවකාලික පත්වීම් ලබාදී තිබේද;

(viii) පසුගිය වර්ෂ 05 තුළ රැකියා විරහිතව සිටි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ix) රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියා ලබා ඇති එවැනි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(x) ඔවුන්ට ස්ථිර රැකියා ලබා දීම සඳහා කිසියම් වැඩපිළිවෙළක් හඳුන්වාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1414/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව උම්බලකඩ සහ කරවල ආනයනය කර තිබේ නම්, වාර්ෂිකව ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම කාලසීමාව තුළ මෙරට නිෂ්පාදනය කර ඇති උම්බලකඩ සහ කරවල ප්‍රමාණය වාර්ෂිකව කොපමණද;

(iii) මෙරට උම්බලකඩ සහ කරවල නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1537/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහ නගර සභාවේ ක්‍රියාත්මකවූ 'සුහුරු වීදි ආලෝකකරණය' ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ආයතනය කවරේද;

(iii) එම ව්‍යාපෘතිය හේතුවෙන් කොළඹ මහ නගර සභාවට සිදුවී ඇති මූල්‍යමය අලාභය කොපමණද;

(iv) ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1842/2026

ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ පාසල් සඳහා අනුමත අනධ්‍යයන සේවක තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා විධිවිධාන යොදා තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 12 සෙනසුරාදා)**

2562/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 55 වැනි පිටුවෙහි සඳහන් 'අලි මිනිස් ගැටුම පාලනය කිරීමට වන අලි ගහනය, සංචරණ රටා හා වාසස්ථාන පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදුකර, ජීව විද්‍යාත්මක හා නව තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් ජන සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම' යන යෝජනාව, 2026.09.01 දිනය වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 දෙසැම්බර් 14 සඳුදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1198/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි යා/ඩෙල්ෆ්ට් සයිවප්‍රභාස විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල අයත් වන පාසල් කාණ්ඩය කවරේද;

(iii) අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පවතින පුරප්පාඩු මෙතෙක් සම්පූර්ණ නොකිරීමට හේතු කවරේද;

(v) පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාලසීමාව කොපමණද;

(vi) ගුරු පුරප්පාඩු හේතුවෙන් එම පාසලේ අධ්‍යාපන කටයුතු සඳහා එල්ලවී ඇති බලපෑම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1665/2025

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් ඉදිකර නඩත්තු කරනු ලබන ක්‍රීඩා සංකීර්ණ, ප්‍රමාණය අනුව වර්ගීකරණය කරන ආකාරය කවරේද;

(ii) ඒ අනුව, එම ක්‍රීඩා සංකීර්ණ මඟින් සපයනු ලබන පුහුණුවීම් කවරේද;

(iii) දිවයින පුරා පිහිටි ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ රජයේ ක්‍රීඩා සංකීර්ණ සහ ඒවා පිහිටි දිස්ත්‍රික්ක කවරේද;

(iv) මේ වනවිට කිසිදු ක්‍රීඩා සංකීර්ණයක් නොමැති දිස්ත්‍රික්ක තිබේ නම්, ඒවා කවරේද;

(v) සෑම දිස්ත්‍රික්කයකම අවම වශයෙන් එක් ක්‍රීඩා සංකීර්ණයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබේද;

(vi) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමට නියමිත කාලරාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1687/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කින්නියා නගර සභාව විසින් නඩත්තු කරනු ලබන ක්‍රීඩාංගන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩාංගනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කින්නියා නගර සභාව විසින් නඩත්තු කරනු ලබන 'එලිල් අරංගු ක්‍රීඩාංගනය' සංවර්ධනය කිරීම සඳහා 2010 සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, මූල්‍ය ප්‍රතිපාදන වෙන් කළ වර්ෂ, එම ප්‍රතිපාදනවල ප්‍රමාණය සහ වෙන් කරන ලද සංවර්ධන වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමකින් තොරව සංවර්ධන කටයුතු සඳහා යොදවා ඇති බව දන්නේද;

(ii) ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු සිදුකළ කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(iii) වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන නිසි පරිදි භාවිතා කරමින් ක්‍රීඩාංගනය සංවර්ධනය කර තිබේද;

(iv) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේදී සිදුවූ බව කියන දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තිබේද;

(vi) එසේ නම්, එම විමර්ශනයට අදාළ තොරතුරු ඉදිරිපත් තරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1966/2026

ගරු (වෛද්‍ය) පද්මනාදන් සත්‍යලිංගම් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොඳුඇට පෙළ ආබාධයට ලක්වීම හෝ වෙනත් හේතු මත එක්තැන්ව සිටින පුද්ගලයන්ගේ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එවැනි පුද්ගලයන් නඩත්තු කිරීම සඳහා පවතින රාජ්‍ය ආයතන, ගාස්තු අයකරන පෞද්ගලික ආයතන සහ පුණ්‍යායතන සංඛ්‍යාව එක් එක් කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එවැනි ආයතන පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) මෙම ආයතන මඟින් රැකබලා ගනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) රජය සතු මෙවැනි ආයතන නඩත්තු කිරීම සඳහා වාර්ෂිකව වැය කරන මුදල කොපමණද;

(v) එම පුද්ගලයන් නඩත්තු කරන පුණ්‍යායතන සඳහා රජය විසින් දිරි දීමනාවක් ලබා දෙන්නේද;

(vi) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) තම නිවෙස්වල සිටින සහ ඥාතීන් විසින් රැකබලා ගනු ලබන එක්තැන්ව සිටින තැනැත්තන් සහ රෝද පුටු භාවිත කරන අඩු ආදායම්ලාභී තැනැත්තන් සඳහා අවශ්‍ය වැසිකිළි ඉදිකිරීමට රජය විසින් සහනාධාර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම සහනාධාරයේ ප්‍රමාණය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2574/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.09.18 දින අනුරාධපුර මහාධිකරණය විසින් ලබා දුන් තීන්දුවට අනුව, ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ පහසුකම් සැලසීම සඳහා මහව සිට වවුනියාව දක්වා සියලු දුම්රිය ස්ථාන නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) 'ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන' යටතේ දුම්රිය ස්ථාන 100ක් නවීකරණය කිරීමේදී ආබාධ සහිත මගීන්ට අවශ්‍ය පහසුකම් සැලසීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) කොටුව දුම්රිය ස්ථානයේ මේ වනවිට ආරම්භ කර ඇති නවීකරණ කටයුතුවලදී ආබාධ සහිත පුද්ගලයන්ට අවශ්‍ය පහසුකම් සැලසීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රධාන දුම්රිය ස්ථාන රෝද පුටු භාවිත කරන්නන්ට ප්‍රවේශ විය හැකි පරිදි නවීකරණය කිරීමට වර්තමාන රජය යටතේ ක්‍රියාත්මක වන නිශ්චිත සැලසුම් කවරේද;

(ii) ආබාධ සහිත පුද්ගලයන්ට දුම්රිය මැදිරිවලට ඇතුළුවීම සඳහා ප්‍රවේශ පහසුකම් සැලසීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) එක් දුම්රිය චේදිකාවක සිට තවත් චේදිකාවකට මාරුවීමේදී අවශ්‍ය ප්‍රවේශ පහසුකම් සැලසීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 දෙසැම්බර් 14 සඳුදා)**

2563/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජන බලවේග රජයේ 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 35 වැනි පිටුවෙහි සඳහන් 'ක්‍රීඩා පහසුකම් පිළිබඳ ජාතික දත්ත ගබඩාවක්' යන යෝජනාව, 2026.09.01 දිනය වනවිට ඉටුකර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2027 ජනවාරි 08 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 5/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට හුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්ට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කනිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බදු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2025

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— ''ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල'' නමින් අරමුදලක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය, සංස්කෘතිය, රැකියාව සහ ජාතීන් අතර පවතින සහයෝගීතාවය සම්බන්ධ ගැටලුවලදී හා එදිනෙදා ජීවනෝපායයන් ඉටුකර ගැනීමේ දී අවශ්‍ය වන අරමුදලක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති හෙයින් ද, මෙම අවශ්‍යතාවයන් සඳහා ''බයිතුල්මාල්'' නමින් අරමුදලක් ලෝකයේ මුස්ලිම් රටවල්වල සහ මුස්ලිම් සුළු ජාතීන් ජීවත්වන රටවල්වල වසර ගණනාවක සිට ස්ථාපනය කර ඇති හෙයින් ද, මෙම අරමුදල ශ්‍රී ලංකාවේ ආරම්භ කළහොත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙරට ජීවත්වන අයගෙන් සහ විදේශීය රටවල්වල ජීවත්වන අයගෙන් සම්පාදනය කරගත හැකිවන හෙයින් ද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ''ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල'' නමින් අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 62/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය ආරම්භ කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ භාණ්ඩ ප්‍රවාහනය හෙයින්ද, මේ වනවිට දුම්රිය සේවය එයින් බැහැර වී ඇති හෙයින්ද, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය වියදම් අඩු ක්‍රමයක් වන හෙයින්ද, එහි ප්‍රතිලාභ රටේ ජනතාවට සෘජුවම අත්වන හෙයින්ද, හැකි සෑම අවස්ථාවකදීම දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම ඉන්ධන ප්‍රවාහනය සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 63/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— සිය කෘෂි නිෂ්පාදන අළෙවි කිරීමේ දී ගොවීන්ට සිදුවන අසාධාරණය අවම කිරීම,— සිය කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී තොග වෙළඳුන් මෙන්ම සිල්ලර වෙළඳුන් විසින් ද ඉතා අඩු මුදලක් නියම කිරීම හේතුවෙන් මෙරට ගොවීන් බරපතල අසාධාරණයකට ලක්වන හෙයින්ද, එකී භාණ්ඩ වෙළඳුන්ගෙන් මිලදී ගැනීමේදී පාරිභෝගික ජනතාවට වැඩි මිලක් ගෙවීමට සිදුව ඇති හෙයින්ද, ගොවියාත්, පාරිභෝගිකයාත් එකවර අසාධාරණයන්ට ලක් කරන්නා වූ මෙකී ක්‍රියාදාමයන් වෙනස් කරමින්, ගොවියාට සහ පාරිභෝගිකයාට සාධාරණයක් ඉටු කර දීම වෙනුවෙන් රජය විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලුම අධ්‍යාපන අවස්ථා අතරින් පෙර පාසල් අධ්‍යාපනය අතිශය වැදගත් සහ තීරණාත්මක වන හෙයින්, ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය එක් ආයතනයකින් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අපනයන නිෂ්පාදකයින්ට පහසුකම් සැපයීම,— අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සහ වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට අපනයන වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම්, දැනුම සහ ප්‍රවේශ මාර්ග නොමැති හෙයින්, විදේශ විනිමය උත්පාදනයේ ප්‍රධාන සංරචකයන් වන අපනයන ක්ෂේත්‍රයේ නියැළී තරුණ ව්‍යවසායකයින්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— උසස් පෙළ විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ට සාහිත්‍යය විෂය හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ පාසල්වල විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ හදාරන සිසුන්ගේ සාහිත්‍ය රසාස්වාදය ඉහළ නැංවීම සඳහා එම විෂය ධාරාවන් සඳහා අමතර විෂයයක් ලෙස සාහිත්‍යය විෂය හඳුන්වා දියයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රෝහල්වල නේවාසික රෝගීන්ට උපස්ථානය සැලසීම,— රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකු අසල, රෝගියාගේ රැකවරණය සඳහා දිවා හා රාත්‍රී කාලයන්හි භාරකරුවෙකු නතර කළ යුතු බවට වාර්තු භාර හෙද නිලධාරින් විසින් දැනුම් දෙනු ලබන හෙයින්ද, එලෙස භාරකරුවෙකු නොමැති අවස්ථාවකදී පෞද්ගලික උපස්ථාන සේවකයින් ගාස්තු ගෙවා ලබා ගත යුතුව ඇති හෙයින්ද, එකී උපස්ථාන සේවකයින් දිනකට රු. 3500 ක පමණ මුදලක් අය කරන හෙයින්ද, දින කිහිපයක් රෝහල් ගතව සිටීමට සිදු වුවහොත් එය දරා ගැනීමට අපහසු මුදලක් වන හෙයින්ද, රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකුගේ රැකවරණය සහ උපස්ථානය, රෝහලේ සේවය කරනු ලබන උපස්ථායකවරුන් විසින් ලබා දීමේ ක්‍රමවේදයක් රජය විසින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ඉඩම් සඳහා බලපත්‍රලාභී ඔප්පු හිමියන්ට ස්ථිර ඔප්පු ලබා දීම,— රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට ස්වකීය ඉඩම සඳහා හිමිව ඇත්තේ බලපත්‍ර හෝ ස්වර්ණ භූමි වැනි ඔප්පු වන හෙයින්, ඔවුන් සඳහා ඔප්පු ලබා දීමේ නිවැරදි ක්‍රමවේදයක් සැකසිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය සහ උතුරු පළාත තුළ තරුණයන් සඳහා තිරසර රැකියා අවස්ථා නිර්මාණය කිරීම පිණිස ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම,— ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම මඟින් රජයට ආර්ථික වර්ධනය උත්තේජනය කොට දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගනිමින් තරුණයින් සඳහා තිරසර රැකියා අවස්ථා ජනනය කළ හැකි හෙයින් ද, එවැනි කලාප සංවර්ධනය කිරීමෙන් රජයට කාර්මික ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම, කුසලතා සංවර්ධනය වැඩි දියුණු කිරීම හා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුළින් විරැකියාවට විසඳුම් ලබාදිය හැකි හෙයින් ද, යාපනයේ උතුරු පළාතේ සහ සමස්තයක් වශයෙන් රටේ දිගුකාලීන සමාජ-ආර්ථික ප්‍රගතියක් ඇති කිරීමට රට පුරා අනෙකුත් උපායමාර්ගික ස්ථාන වලට සමගාමීව යාපනයේ සහ උතුරු පළාතේ ද ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් (SEZ) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 73/2025

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සම්පන්නභාවය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දීම,— ජනගහනයෙන් බහුතරයක් විවෘත හදවත් සැත්කම්වලට භාජනය වන හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දිය යුතු බවටත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හරහාද, රජයේ සේවකයින්ට සහ රැකියා නියුක්තිකයන් නොවන අයට රජය විසින් ජනාධිපති අරමුදල හරහාද පූර්ණ පිරිවැය සහිතව නොමිලේ පහසුකම් සලසා දිය යුතු බවටත් මෙම සභාව යෝජනා කර සිටී.

පා. 74/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— සතියේ වැඩ කරන දිනවල ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන කාලයේ දී සහ සවස් කාලයේ දී බස් ප්‍රමුඛතා මංතීරු කඩිනමින් ඇති කිරීම,— ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන හා සවස් කාලයේදී පවතින දැඩි මාර්ග තදබදයට පිළියමක් ලෙස උදෑසන සහ සවස් කාලයන්හිදී බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමයක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 75/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම යාවත්කාලීන කිරීම,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම මඟින් ශ්‍රී ලාංකිකයන්ට විශාල ප්‍රතිලාභ හිමිවන හෙයින්, එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 76/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— සුහුරු විදුලිබල පද්ධතියක් සහ සුහුරු මීටර් හඳුන්වා දීම,— පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයක් ලෙස සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය ඉතා වැදගත් වුවත්, විශේෂයෙන්ම වහල මත සවිකරන ලද සූර්ය පැනල මඟින් ජනනය වන විදුලි ප්‍රමාණය, පද්ධති පාලන මධ්‍යස්ථානයේ දී වෙන්කර හඳුනාගත නොහැකි හෙයින්, ජාතික විදුලිබල පද්ධතිය (Grid) සුහුරු තත්ත්වයට (Smart Grid) පත්කිරීමටත්, සුහුරු මීටර් (Smart Meters) හඳුන්වා දීමටත් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 77/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආහාර රස ගැන්වීමට යොදන අහිතකර කෘත්‍රිම රසකාරක තහනම් කිරීම,— රයිස්, කොත්තු හා නූඩ්ල්ස් වැනි ආහාර රස ගැන්වීමට මෙරට ආපනශාලා සහ හෝටල්වලදී යොදන කෘත්‍රිම රසකාරක, නොයෙක් බෝ නොවන රෝගවලට හේතු වන බව වාර්තාවන හෙයින්, ඒ පිළිබඳව පිළිගත් ආයතනයක් මඟින් නිසි අධ්‍යයනයක් සිදුකර, එම අහිතකර රසකාරක තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආයතන ප්‍රධානීන් පත්කිරීමේ නිර්ණායකයක් ලෙස ප්‍රධාන කාර්ය සාධන දර්ශකය යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය සේම ඔවුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPl - Key Performance Indicator) නිර්ණායකයක් ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් රාජ්‍ය සේවයට ඇතුළත් කොට, ඒ අනුව ආයතන ප්‍රධානීන් පත්කිරීමට නිර්දේශ ලබා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් හට තනතුරු ලබා දීමේ දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සලකා බැලීම, — පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ අමාත්‍යවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI - Key Performance Indicator) වාර්ෂිකව පරීක්ෂා කර, ඔවුන්ට තනතුරු ලබා දීමේ දී එකී දර්ශකය සලකා බලා, තනතුරු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන් වෙනත් තනතුරුවලට පත්කිරීමේ දී ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම, — අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන්, ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, එකී තනතුරු දැරීම නතර වූ තැන් සිට අවම වශයෙන් වසර තුනක කාලයක් රාජ්‍ය සේවයේ, සංස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, විනිශ්චය මණ්ඩලවල හෝ විදේශ සේවයේ (තානාපති වැනි) තනතුරුවලට පත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නතර කිරීම,— දේශපාලන පක්ෂ විසින් තම පක්ෂයෙන් තේරී පත් වූ මහජන නියෝජිතයින්ගේ මාසික වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය එම පක්ෂවලට ලබා ගැනීම මහජන නියෝජිතයින්ගේ ස්වාධීනත්වය අහෝසි වන ක්‍රියාවක් වන හෙයින් ද, එය ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල අභියෝගයක් වන හෙයින් ද, මෙලෙස දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 87/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෑම දිස්ත්‍රික්කයකම මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— මේ වනවිට හෙරොයින් වැනි මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙන හෙයින් ද, ඒ සඳහා ඇබ්බැහිවූවන් ප්‍රදේශයකට සීමා නොවී රට පුරා ව්‍යාප්තව සිටීම සහ ඔවුන්ගෙන් ප්‍රචාරණය වීම මෙයට හේතු වී තිබෙන හෙයින් ද, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන රට පුරා ස්ථාන කිහිපයක පමණක් පැවතීම මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ වර්ධනය පාලනය කිරීමට දැඩි ගැටලුවක්ව ඇති හෙයින් ද, එයට විසඳුමක් ලෙස සියලු පහසුකම් සහිතව අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය රටේ ආර්ථිකයේ මූලික අංශයක් වන හෙයින් ද, වාර්ෂිකව නිෂ්පාදන ක්‍රියාවලියට යොදවනුයේ කෘෂිකාර්මික ඉඩම්වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් පමණක් වන හෙයින් ද, ඉතිරි ඉඩම් නිසි ලෙස සැලසුම් නොකිරීම, ජල සම්පත් හිඟය, තාක්ෂණික දැනුම නොමැති වීම සහ නව්‍යකරණය නොවීම හේතුවෙන් භාවිතා නොවන හෙයින් ද, නිෂ්පාදන මට්ටම අඩු වීම මඟින් ආහාර ආනයනය සඳහා වසරකට විශාල මුදලක් වැය වන හෙයින් ද, කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්ධනය ඉදිරි වසර කිහිපය තුළ 30% කින් වැඩි කිරීමටත්, ඉන් ගොවීන්ගේ ආදායම වැඩි කිරීමටත්, වාණිජ කෘෂිකර්මයේ ව්‍යාප්තිය වැඩි කිරීමටත්, සියලුම කෘෂිකාර්මික භූමි ගවේශණය කර, භූමියෙහි වර්ගය, බෝගවලට යෝග්‍ය බව, ජලය සහ ගොවිතැන පිළිබඳ තොරතුරු ඇතුළත් මූලික දත්ත පද්ධතියක් සකස් කිරීම මඟින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමටත්, ගොවීන්ගේ ජීවන මට්ටම උසස් කිරීමටත්, ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන් සඳහා මුහුදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ විශේෂයෙන් නෙඩුන්තීව්, නයිනතීව්, එලුවයිතීව් සහ අනලයිතීව් වැනි අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන්ට දශක ගණනාවක් තිස්සේ ප්‍රමාණවත් මුහුදු ප්‍රවාහන පහසුකම් අහිමි වී ඇති හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන්ට මුහුදු මාර්ගයෙන් පැය කිහිපයක් ගමන් කිරීමට සිදු වන හෙයින් ද, රෝගීන්, ගර්භනී කාන්තාවන්, වැඩිහිටියන්, පාසල් කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය නොවන සංවිධානවල සේවකයින් මෙම ගමන්වලදී දැඩි දුෂ්කරතා සහ අවදානම්වලට මුහුණ දෙන හෙයින් ද, ''ගම් සංවර්ධනය ජාතියේ සංවර්ධනය'' බව පිළිගෙන ඇති හෙයින් ද, එම දූපත්වල පදිංචිකරුවන්ට නවීන, ආරක්ෂිත, වේගවත් සහ විශ්වාසදායක මුහුදු ප්‍රවාහන පහසුකම් සැපයීමට රජය වහාම පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම,— තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවය ආරම්භ කිරීම මඟින් විශේෂයෙන්ම ඉන්දියාවේ සිට මෙරටට සංචාරකයින් පැමිණීම වැඩි කරනු ලැබිය හැකි හෙයින් ද, එමඟින් මහජනතාවට අඩු වියදමකින් තමිල්නාඩුවට ගමන් කර පවතින නීති හා රෙගුලාසිවලට යටත්ව දැරිය හැකි මිලකට අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමට හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කළ හැකි හෙයින් ද තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම සඳහා රජය වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීම,— පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් සිදුකරන පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අතිශයින් දූෂිත තත්ත්වයට පත්වී තිබෙන බැවින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා සුදුසු වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ බලශක්ති මූලාශ්‍රයන් අතරින් සූර්ය විදුලි බලය ලාබදායි සහ පරිසර හිතකාමී මූලාශ්‍රයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, 2016.09.06 දින ආරම්භ කරන ලද 'සූර්ය බල සංග්‍රාමය' (Battle for Solar Energy) ව්‍යාපෘතිය මඟින් දැනටමත් ජාතික විදුලි පද්ධතියට සූර්ය විදුලි බලය 2000 MWට වැඩි ප්‍රමාණයක් එක් කර ඇති හෙයින් ද, විදුලි ඒකකයක මිල අඩු කිරීමේ ක්‍රමවේදයක් සහ පරිසරය ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස, 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කොට ආරක්ෂා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'කළුතර මුහුදු වෙරළ කලාපය' විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම,— කළුතර නගරය මුල් කරගත් සංචාරක කලාපයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් ද, කළු ගඟේ මෝය සහ මුහුදු වෙරළ ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස ද, කැලිඩෝ මුහුදු වෙරළ සහ කළු ගඟේ මෝය වෙනස් වීම හේතුවෙන් අලුතින් බිහිවී ඇති ගොඩබිම ඇතුළත්, 'කළුතර මුහුදු වෙරළ කලාපය', විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කොට සංවර්ධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' ඉදිකිරීම කඩිනම් කිරීම,— කළුතර දිස්ත්‍රික්කයේ, 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' (Millaniya Export Processing Zone) සඳහා අවශ්‍ය ඉඩම් අක්කර 240ක් දැනටමත් පවරා ගෙන ඇති හෙයින් ද, එම ව්‍යාපෘතිය සඳහා අධිවේගී මාර්ග පිවිසුම්, නළ ජලය සහ විදුලිය ලබා දීම සඳහා රජය විසින් රුපියල් බිලියනයකට ආසන්න මුදලක් දැනටමත් වැයකර ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය සඳහා තෝරාගත් භූමිය එවැනි ව්‍යාපෘතියක් සඳහා සුදුසු බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දැනටමත් හඳුනාගෙන ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය ඉදිකිරීම රජයේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස සලකා අවශ්‍ය ඉදිරි පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතියික අධ්‍යාපනය ලබාදීම ප්‍රවර්ධනය කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) ව්‍යවස්ථාව ප්‍රකාරව 'ඉංග්‍රීසි භාෂාව' ශ්‍රී ලංකාවේ සන්ධාන භාෂාව (Link Language) ලෙස පිළිගෙන ඇති හෙයින් ද, ජාත්‍යන්තර භාෂාවක් වන 'ඉංග්‍රීසි භාෂාව' පුරවැසියන්ට දැනුම ලබා ගැනීමේ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට භාෂා හෝ ජාති භේදයක් නොමැතිව එකම රටක ජීවත් වීම සඳහා අවශ්‍ය වන සන්ධාන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගැනීම ඉතා වැදගත් වන හෙයින් ද, නිදහස් අධ්‍යාපන සංකල්පය තුළ බිහි වූ ශ්‍රී ලංකාවේ මධ්‍ය මහා විද්‍යාල පද්ධතිය තුළ සහ තවත් පාසැල් ගණනාවක ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතීයික අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවේදය සාර්ථක වී ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ජාත්‍යන්තර රැකියා අවස්ථාවන් ලබා ගැනීම උදෙසා ඉංග්‍රීසි භාෂාවෙන් ලැබෙන අධ්‍යාපනය අතිශය වැදගත් වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලුම ද්විතියික පාසැල් වල (Secondary Schools) ඉංග්‍රීසි මාධ්‍යයෙන් (English Medium) අධ්‍යාපනය ලබා දිය යුතු යැයි ද, ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සිදු කිරීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කිරීම,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ තුළ අවශ්‍යතා සපුරාලන නවීන තාක්ෂණික උපාධිධාරීන් පිරිසක් සපයන විශ්වවිද්‍යාලයක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වර්ධනය වන ඉදිකිරීම්, කාර්මික, කර්මාන්ත සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල මෙන්ම ගෝලීය අවශ්‍යතාවන් ද සලකමින්, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/2025

ගරු රෝහණ බංඩාර මහතා,— පිහිනුම් කුසලතාවය ඉහළ දැමීමේ වැඩසටහනක් සකස් කිරීම,— දියෙහි ගිලී මිය යන පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන බව මෑත කාලීනව නිරීක්ෂණය වන හෙයින්, ඉතා උසස් වාරි ශිෂ්ඨාචාරයකට හිමිකම් කියන අතීත ජනතාව තුළ පැවති පිහිනුම් කුසලතාවය, වත්මන් පරපුර තුළ ද ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 109/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම,— වසර 26 කට වැඩි කාලයක් පුරා පැවැති උතුරු නැගෙනහිර යුද්ධය නිසා සිදු වූ ජීවිත හානි, අතුරුදහන්වීම් සහ අනෙකුත් විනාශයන් සොයා බැලීම සඳහා ද, ජාතික සමඟිය ඇති කිරීම සහ ඒ වෙනුවෙන් ගත හැකි ඉදිරි පියවර සොයා බැලීම සඳහා ද වන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් (Truth Commission) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 110/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීම,— අධික සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් ළමුන් අතර මානසික පීඩනය සහ ආතතිය වැඩිවීම, අධ්‍යාපන කාර්ය සාධනය පහළ යාම, සයිබර් හිංසන (cyberbullying), අශෝභන හා අනාරක්ෂිත අන්තර්ගතයන්ට නිරාවරණය වීම වැනි ගැටලු වැඩිවෙමින් පවතින හෙයින් ද, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය හා ඩෙන්මාර්ක් වැනි දියුණු රටවල් මේ වනවිටත් ළමුන් සඳහා සමාජ මාධ්‍ය භාවිතය සීමා කිරීමට නීති හඳුන්වා දී තිබෙන හෙයින් ද, ළමුන්ගේ මානසික සෞඛ්‍යය, ආරක්ෂාව සහ අධ්‍යාපනමය වර්ධනය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජ මාධ්‍ය ගිණුම් විවෘත කිරීම සඳහා අවම වයස අවුරුදු 15 ලෙස නියම කිරීම, සමාජ මාධ්‍ය සමාගම් සඳහා වයස් සත්‍යාපන ක්‍රම අනිවාර්ය කිරීම, නීතිය උල්ලංඝනය කරන ආයතන සඳහා දඩ සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ වැඩිහිටියන්ගේ ගිණුම් භාවිතා කරමින් සමාජ මාධ්‍ය භාවිතා කරන දරුවන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු ක්‍රියාවට නැංවීම සඳහා වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 112/2026

ගරු ඥානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කිරීම,— ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් වසර 40 කට වැඩි කාලයක් තිස්සේ දිගු කාලීන අත්තනෝමතික රඳවා තබා ගැනීම්වලට ඉඩ සලසා ඇති හෙයින් ද, වධහිංසා මඟින් ව්‍යාජ පාපොච්ඡාරණ ලබා ගැනීම සඳහා සහ සුළු ජන කොට්ඨාස සහ සිවිල් සමාජ කණ්ඩායම් ඉලක්ක කර ගැනීමට භාවිතා වී ඇති හෙයින් ද, අත්‍යවශ්‍යම මොහොතක දී හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට හැකියාව පවතින හෙයින් ද, ත්‍රස්තවාදයට සම්බන්ධ වැරදි සඳහා දැනටමත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ නඩු පැවරීමට හැකියාව පවතින හෙයින් ද, පුළුල් බලතල සහිත ස්ථීර ත්‍රස්ත විරෝධී නීතියක් සඳහා කිසිදු සාධාරණීකරණයක් නොමැති බැවින් ද, ශ්‍රී ලංකා රජය විසින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, එම පනතට සමාන නීතිමය විධිවිධාන අඩංගු නීතියක් හඳුන්වා දීමකින් තොරව, සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සඳහා වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 114/2026

ගරු රවී කරුණානායක මහතා, — ලෝක පරිසරය සුරැකීම, — ලෝක පරිසරය සුරැකීම කෙරෙහි ශ්‍රී ලංකාව වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු බවත්, විශේෂයෙන්ම ගෝලීය උණුසුම ඉහළ යාම වැළැක්වීම සඳහා පියවර ගත යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 115/2026

ගරු රවී කරුණානායක මහතා,— මූල්‍ය වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම,— ලියාපදිංචි මූල්‍ය සමාගම් තුළ මුදල් තැන්පත් කර මූල්‍ය වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන්ට එම මුදල් නැවත ගෙවීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතු බවත්, එකී සමාගම් තුළ මුදල් තැන්පත් කර වංචාවන්ට හසු වූ තැන්පත්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටින බැවින්, එකී සමාගම්වල භාරකාර ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුව මෙහිදී කාර්යක්ෂමව ක්‍රියා කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 116/2026

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ රෝහල් පද්ධතිය තුළ බාහිර රෝගී අංශවල පවතින තදබදය අවම කිරීමට වැඩසටහනක් සකස් කිරීම,— ලෝක සෞඛ්‍ය දර්ශකයේ අප රටෙහි ස්ථානය කුමක් වුව ද, රජයේ රෝහල්වල බාහිර රෝගී ප්‍රතිකාර ඒකකයන් හි පවතින දැඩි තදබදය පාලනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 117/2026

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අලි-මිනිස් ගැටුම බහුලව පවතින ප්‍රදේශවල මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— සංඛ්‍යා දත්ත වාර්තාවලට අනුව අලි-මිනිස් ගැටුම ඉහළින්ම පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මේ වනවිට පත්ව ඇති හෙයින් ද, ඒ හේතුවෙන් වාර්ෂිකව මිනිසුන් හා අලි ඇතුන් විශාල සංඛ්‍යාවකගේ ජීවිත අහිමි වන හෙයින් ද, දේපළ ඇතුළු භෞතික සම්පත් විනාශ වන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස කෙන්යාව වැනි රටවල ක්‍රියාත්මක වන පරිදි, අලි-මිනිස් ගැටුම සිදුවන ප්‍රදේශවල මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 119/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ සෙසු දිස්ත්‍රික්කවල සේවය කරන යාපනය දිස්ත්‍රික්කයට අයත් ගුරුවරුන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ යහපත පිණිස විධිමත් නවාතැන් පහසුකම් හෝ මහල් නිවාස ව්‍යාපෘති ඇති කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ සිට කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට අනුයුක්තව බොහෝ දුෂ්කරතා මධ්‍යයේ සේවය කරන රාජ්‍ය නිලධාරීන්ගේ සහ ගුරුවරුන්ගේ ප්‍රවාහන අපහසුතා සහ නවාතැන් ගැටලුවලට ස්ථිර විසඳුමක් ලබාදීම සහ ඔවුන්ගේ සේවය කාර්යක්ෂමව ලබා ගැනීම සහතික කිරීම සඳහා, ඒ ඒ දිස්ත්‍රික්කයන්හි කේන්ද්‍රීය ප්‍රදේශයක හෝ උචිත ස්ථානයක සියලු පහසුකම්වලින් සමන්විත විධිමත් නවාතැන් පහසුකම් හෝ මහල් නිවාස ව්‍යාපෘති රජය විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 120/2026

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— ශ්‍රී ලංකාවේ සාගර සම්පත් කාර්යක්ෂමව පරිහරණය කිරීමට සහ මුහුදු ආශ්‍රිත කර්මාන්ත වැඩි දියුණු කිරීමට මුලතිව් දිස්ත්‍රික්කය තුළ සාගර විශ්වවිද්‍යාලයක් (Ocean University) ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාව වටා ඇති ගැඹුරු මුහුදු සහ වෙරළාසන්න සාගර සම්පත් විද්‍යාත්මකව හා තාක්ෂණිකව මෙහෙයවීමට අවශ්‍ය මානව සම්පත නිර්මාණය කිරීම මඟින් රටේ ආර්ථිකය ශක්තිමත් කළ හැකි හෙයින්, උතුරු පළාතේ ඉහළ සාගර විභවතාවක් සහිත මුලතිව් දිස්ත්‍රික්කයේ

ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය නවීකරණය කිරීමටත්, තරුණ තරුණියන්ට සාගර ඉංජිනේරු විද්‍යාව, සාගර ගවේෂණය සහ ජලජ සම්පත් කළමනාකරණය වැනි ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමටත්, සියලු පහසුකම්වලින් සමන්විත සාගර විශ්වවිද්‍යාලයක් මුලතිව් දිස්ත්‍රික්කය තුළ ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 121/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ දූපත් ආශ්‍රිත ප්‍රදේශවල සහ වෙරළාසන්න ගම්මානවල පවතින දැඩි පානීය ජල හිඟයට ස්ථිර විසඳුමක් ලෙස මුහුදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘති (Desalination Plants) පුළුල් කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල භූගත ජලය, කිවුල් ජලය බවට පරිවර්තනය වෙමින් පවතින හෙයින් ද, විශේෂයෙන්ම වේලනෙයි සහ නාගදීපය වැනි දූපත් ප්‍රදේශවල ජනතාව පානීය ජලය ලබා ගැනීමේ දී දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙන හෙයින් ද, නාගදීපය වැනි ප්‍රදේශවල දැනටමත් පවතින ජල පිරිපහදු මධ්‍යස්ථානවල ධාරිතාව ඉහළ නැංවීමත්, කුරිකට්ටුවාන් හරහා නළ මාර්ගයෙන් ජලය සැපයීමේ ව්‍යාපෘතිය කඩිනම් කිරීමත් මඟින් ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන පිරිසිදු පානීය ජලය මෙම ප්‍රදේශවල ජනතාවට ද ලබා දීම සහතික කිරීම සඳහා මුහුදු ජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘති පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 122/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ තරුණයින් අතර ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මත් ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීම සහ නවීන පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම,— උතුරු පළාතේ මෑතක සිට ඉහළ ගොස් ඇති මත්ද්‍රව්‍ය ජාවාරම හා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සමාජ පද්ධතිය බිඳවැටීම සහ පාසල් සිසුන්ගේ අනාගතයට බලපෑම් එල්ල වන හෙයින්, මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ ජාලය මැඩලීම සඳහා ආරක්ෂක අංශ සම්බන්ධීකරණය කර ගනිමින් විශේෂ වැටලීම් වැඩි කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීමටත්, මත්ද්‍රව්‍යවලට ගොදුරු වූ තරුණයින් යහමඟට ගැනීම සඳහා උතුරු පළාත තුළ සියලු පහසුකම් සහිත රජයේ පුනරුත්ථාපන සහ උපදේශන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමටත් රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 123/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ තල් සහ පොල් මූලික කරගත් අපනයන කර්මාන්තශාලා ස්ථාපනය කර රැකියා විරහිත උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම,— උතුරු පළාතේ බහුලව පවතින තල් සහ පොල් හුදෙක් අමුද්‍රව්‍ය ලෙස පමණක් භාවිතා නොකර, නවීන තාක්ෂණය භාවිතයෙන් අගය එකතු කළ නිෂ්පාදන නිපදවන අපනයන කර්මාන්තශාලා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහභාගිත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවීමටත්, එමඟින් එම ප්‍රදේශවල රැකියා විරහිත තරුණ තරුණියන්ගේ සහ උපාධිධාරීන්ගේ ජීවනෝපාය මාර්ග සුරක්ෂිත කිරීමටත් රජය සැලසුම් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 124/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ ආරක්ෂක හමුදා භාරයේ ඇති මහජනතාවගේ ඉඩම් නිදහස් කිරීම සහ කෘෂිකාර්මික හා ධීවර කටයුතු සඳහා එම ඉඩම් පරිහරණය කිරීමට අවසර ලබාදීම,— යුද්ධයෙන් පසුව සිදුකෙරුණු නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී, මහජනතාවගේ ඉඩම් මෙතෙක් මුළුමනින්ම නිදහස් කර නොමැති හෙයින් ද, ඒ හේතුවෙන් ඔවුන්ගේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතුවල සහ ධීවර කර්මාන්තයේ නිරතවීමේ අවස්ථා අහිමි වී ඇති හෙයින් ද, මෙතෙක් නිදහස් කර නොමැති මහජනතාවගේ ඉතිරි ඉඩම්, ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන පරිදි කඩිනමින් නිදහස් කිරීමටත්, මහජනතාවගේ ජීවනෝපාය මාර්ග යළි නගාසිටුවීම සඳහා කෘෂිකාර්මික හා ධීවර කටයුතු වෙනුවෙන් එම ඉඩම් පරිහරණය කිරීමට අවසර ලබාදීමටත් රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 128/2026

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— උතුරු පළාතේ වන්නි සහ යාපනය දූපත් ප්‍රදේශයන්හි පාසල්වල පවතින ගුරු හිඟය සහ ඩිජිටල් අධ්‍යාපන ගැටලු සඳහා විසඳුම් ලබා දීම,— වන්නි සහ යාපනය දූපත් ප්‍රදේශයන්හි පාසල්වල පවතින ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා වූ ගුරු පුරප්පාඩු දිස්ත්‍රික් මට්ටමේ පත්වීම් තුළින් පිරවීමටත්, එම ප්‍රදේශවල සිසුන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා නවීන පරිගණක විද්‍යාගාර සහ විධිමත් අන්තර්ජාල පහසුකම් ලබා දීමටත් සහ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල්වල සිසුන්හට අමතර අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා විශේෂ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමටත් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 129/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම,— උණ, වේවැල්, පන් හා කිතුල් ආදී ශාකවල කඳන්, ව්‍යාජ කඳන් හා පත්‍ර ප්‍රයෝජනයට ගනිමින් සිදුකරනු ලබන සාම්ප්‍රදායික කර්මාන්ත මඟින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා සංචාරක ක්ෂේත්‍රයන් සඳහා විශේෂ දායකත්වයක් ලබා දිය හැකි හෙයින්, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ හා සංචාරක ක්ෂේත්‍රයේ වර්තමාන පිබිදීමට සමගාමීව එකී සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය ලබා දීමටත්, එම නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ වර්ධනය කිරීමටත්, ඒ සඳහා නිල පිළිගැනීමක් ලබා දීමටත්, මහා පරිමාණ කර්මාන්ත ඇති කිරීම සඳහා එම වගාවන් ප්‍රවර්ධනය කිරීමටත්, ඒ සඳහා ව්‍යවසායකයන් දිරිමත් කිරීමටත්, එම ශිල්පීන්ගේ ශ්‍රමයට හා කුසලතාවන්ට ඉහළ වටිනාකමක් ලබා දීමටත් සහ ඔවුන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමටත් අවශ්‍ය මෙහෙයුම් යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 131/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පොදු ස්ථාන සහ රාජ්‍ය ආයතනවල සූර්ය බලයෙන් ක්‍රියා කරන ආරෝපණ ඒකක සවිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම,— විදුලියෙන් පමණක් ක්‍රියා කරන යතුරු පැදි සහ වාහන භාවිතය මේ වනවිට ජනතාව අතර ප්‍රචලිතව ඇති හෙයින් ද, එය පරිසර දූෂණය අවම කිරීමට ඉතාමත් වැදගත් පියවරක් වන හෙයින් ද, එය වර්තමානයේ පවත්නා අධික ඉන්ධන පරිභෝජනයට විසඳුමක් මෙන්ම ඉන්ධන සඳහා වැය වන අධික පිරිවැයට සාධාරණ විසඳුමක් වන හෙයින් ද, විදුලි යතුරු

පැදි සහ වාහන භාවිතය හේතුවෙන් විදුලි පරිභෝජනය ඉහළ යා හැකි හෙයින් ද, යම් විදුලි කප්පාදුවක් ඇති වුවහොත් ඒවා භාවිතා කරන ජනතාව උග්‍ර පීඩාවකට ලක්වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති හෙයින් ද, විදුලි යතුරු පැදි සහ වාහන භාවිතා කරන ජනතාවට සහනයක් ලබා දීමට මෙන්ම විදුලි යතුරු පැදි සහ වාහන මඟින් දුර ගමන් යන ජනතාවගේ යතුරු පැදි සහ වාහනවල බැටරිය ආරෝපණය කර ගැනීමේ පහසුව සඳහා පොදු ස්ථානවල සහ රාජ්‍ය ආයතන පරිශ්‍රවල සූර්ය බලයෙන් ක්‍රියා කරන ආරෝපණ ඒකක (Solar Charging Points) සවිකිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 134/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— 1988/90 කාලසීමාවේ සිදු වූ සිවිල් යුධමය තත්ත්වය සහ එවැනි තත්ත්වයක් නැවත ඇති වීම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම,— 1988/90 කාලසීමාවේ ශ්‍රී ලංකාවේ සිදු වූ ජනතා විමුක්ති පෙරමුණ මූලික කරගත් සිවිල් යුධමය තත්ත්වය තුළ ඇති වූ විනාශයේ, ආර්ථිකමය වටිනාකම සහ සත්‍ය වශයෙන්ම එම තත්ත්වයට හේතු වූ සිදුවීම් පිටුපස තිබූ තරුණ නැගිටීම, එහි දේශපාලන මතවාදයන් මෙන්ම, එවැනි තත්ත්වයක් නැවත ඇති නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මනා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 137/2026

ගරු සුරංග රත්නායක මහතා,— ත්‍රිරෝද රථ හිමියන්ට විශේෂ සහන සහ පහසුකම් ලබාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ ත්‍රිරෝද රථ ප්‍රවාහන සේවය, මහජනතාවගේ දෛනික ගමනාගමන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉතා වැදගත් සේවාවක් ඉටු කරන හෙයින් ද, 'PickMe' සහ 'Uber' වැනි ඩිජිටල් ප්‍රවාහන සේවාවන්ට සම්බන්ධ නොවී ස්වාධීනව සේවය කරන ත්‍රිරෝද රථ හිමියන් සහ රියදුරන් ආර්ථික හා වෘත්තීයමය අභියෝග රැසකට මුහුණ දෙන හෙයින් ද, ඉන්ධන මිල ඉහළ යාම සහ ඉන්ධන ලබා ගැනීමේ අපහසුතා හේතුවෙන් ස්වාධීන ත්‍රිරෝද රථ රියදුරන්ගේ දෛනික ආදායමට සහ ජීවනෝපායට දැඩි බලපෑමක් එල්ල වී ඇති හෙයින් ද, ඔවුන් සඳහා විශේෂ සහන සහ පහසුකම් ලබාදීම වෙනුවෙන් විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා, සුදුසු නියාමන සහ වෘත්තීය ආරක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමටත්, වෘත්තීය ත්‍රිරෝද රථ රියදුරන් සඳහා ලියාපදිංචි ක්‍රමවේදයක් මත විශේෂ ඉන්ධන කෝටාවක් (Fuel Quota) හෝ සහනදායී ඉන්ධන ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කිරීමටත් අවශ්‍ය පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.